# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1952/2 - 2016 පෙබරවාරි මස 01 වැනි සඳුදා - 2016.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : සීඑස්ජ්/7/සීඕඅයි/එම්එස්/01.

### අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර
2. දේගිරි අමේන්ද්‍ර මෙන්ඩිස් සෙනෙවිරත්න මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර
3. කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර
4. පස්දුන්කෝරලේ ආරච්චිගේ ප්‍රේමතිලක මැතිතුමා
   විශ්‍රාමික විගණකාධිපති
5. විකුම් අතුල කළුආරච්චි මැතිතුමා
   මහාධිකරණ විනිසුරු

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය) 2 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මවිසින් 2015ක් වූ මාර්තු මස 03 දිනැති අධිකාර පත්‍රය මගින්, බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත් වරප්‍රසාද බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබ ඇති හෙයින් ද,



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම කොමිෂන් සභාවට ලැබී ඇති පෙත්සම්වල ස්වභාවය අනුව, පැවරී ඇති කාර්යය භාරය ඵලදායීව ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අතිරේක බලතල අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් ඉල්ලීමක් කරනු ලැබ ඇති හෙයින් ද.

2008 අංක 16 දරන පනතින් සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 8 වන වගන්තියේ (අ) සහ (ආ) යන උපවගන්තීන් යටතේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බලතල ද මෙම කොමිෂන් සභාව වෙත ම විසින් තවදුරටත් පවරා දෙනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා පක්ෂපාතීත්වය ගැන මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත අධිකාර පත්‍රය මගින් පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉහතින් දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියළුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහසයක් වූ ජනවාරි මස 30 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

02 - 458

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.